# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 11
NUMBER 02

✻ ✻ ✻ ✻ ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත ✻ ✻ ✻ ✻
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY 10, 2008 මැයි මාසය (බුද්ධ වර්ෂ 2552 වෙසක් මාසය)


**පාඨක ඔබ සැමට සුබ වෙසක් මංගල්‍යයක් වේවා ! HAPPY VESAK TO ALL OUR READERS !**



4th Century, Ghandara style Buddha head in Kabul Museum-

Just as a mother protects her only child,
Even at the risk of her life,
One should cultivate boundless clemency,
Towards all living beings,
Said the Awakened Master,
With oceans of compassion.
Then the entire universe
Illuminated by his words,
Banishing the darkness of
Hatred and ignorance.
As my only refuge,
Homage! To the Blessed One.
In the morning, noon and
Evening all the same!

*- Daya Ananda*

මවක් රක්නා ලෙස එකම පුතු
තමන් ප්‍රාණය නොසලකා හැර
සියල් සතුනට වඩන ලෙස මෙත
ලොවට වදහළ කුළුණු සාගර
අවිද්‍යාවෙන් අඳුරු සක්වල
එකළු කළ භගවත් දිවාකර
දොහොත් මුදුනත තබා වඳිනෙමි
උදය දහවල රැයද එක යුර

♦ *දයා ආනන්ද රණසිංහ*

# අධිෂ්ඨානයෙන් ඉදිරියට යමු !

***සංජය විමලරත්න විසිනි***

**මේ** වෙසක් සමයේ බුදුන්වහන්සේ වදාළ දහමෙන් පැහැදිලි කළ යථාර්ථාවබෝධය නොහොත් තත්වය ඇති සැටියේ දැකීම මෙන් ම ඒ අනුව කටයුතු කිරීමත් වැදගත් වෙයි. මෙය අප ජීවිතයට මෙන්ම රටක් ජාතියක් වශයෙන්ද, ලෝකය වශයෙන්ද එකසේ අදාළය. ඒ අනුව අප දේශයේ අද තත්වය ගැන යමක් කතාකිරීම අද මෙහි අරමුණයි.

මැයි 10 දාට යෙදී ඇති නැගෙණහිර පළාත් සභා ඡන්දයට රටේ කාගේත් අවධානය යොමුවී ඇති වැදගත්ම දේ වෙයි. වසර 20 කට පසු පළමුවරට නැගෙණහිර පළාතේ වැසියන්ට සිය ඡන්දය පාවිච්චි කිරීමේ ජන්ම අයිතිය මින් තහවුරු වෙයි. මෙය හැකිවී ඇත්තේ රජයේත්, විශේෂයෙන් අප ආරක්ෂක හමුදාවන්ගේත් උත්සාහයත්, ලාංකික දේශප්‍රේමීන්ගේ අනුග්‍රහයත් නිසා ඒ ප්‍රදේශවලින් ත්‍රස්තවාදී කොටින් පළවාහැර මුදාගන්මේ ප්‍රථිඵලයක් වශයෙනි.

මේ ලිපිය පුවත්පතින් ඔබ කියවන විට එම ඡන්දය පවත්වා ප්‍රථිඵලද ලැබී තිබෙනු ඇත. මේ ලියන මෙහොතේ නම් එම පළාතේ ජනතාව එම ඡන්දය පිළිබඳව ඉතා උනන්දුවෙන් පෙර මග බලන බවක් කිවයුතු ය. රජයේ ද අනුග්‍රහය ඇතිව පිල්ලෙයාන් හෙවත් චන්ද්‍රකාන්තන් ගේ නායකත්වයෙන් යුතු **TVMP** පක්ෂයත්, මුස්ලිම් කණ්ඩායම් එකතුව සැදුණ එක්සත් ජනතා විමුක්ති පෙරමුණත් **(UPFA)** තරඟකරති. මාර්තුවේ මඩකලපුවේ නගර සභාව සඳහා පැවැත්වූ ඡන්දයේදී සියළුම ආසන දිනාගැන්මෙන් එම **TVMP** කණ්ඩායම ලද විශිෂ්ඨ ජයග්‍රහණයම නැගෙණහිර ජනතාවගෙන් ඔවුන් ලත් පිළිගැන්ම පැහැදිලිවෙයි. පිල්ලෙයාන් ප්‍රමුඛ එම කණ්ඩායම ප්‍රභාකරන්ලාගේ කොටි හමුදාවෙන් කැඩී ඔවුන්ට විරුද්ධව මුල සිටම අරගල කොට නැගෙණහිරින් කොටි පළවා හැරීමට හමුදා සටනට ද උදව් වන පරිදි ආයුධ සන්නද්ධ මෙන්ම දේශපාලන අරගලයක යෙදුනෝ වෙති. අද ඔවුන් ආයුධ අතහැර දේශපාලන පක්ෂයක් ලෙස මෙම ඡන්දයට පිවිස ඇත.

උතුරු සහ නැගෙණහිර පළාත් දෙක වෙන්කිරීමට සහ නැගෙණහිර පළාතෙන් කොටි පළවාහැරීමට රජය සහ ජනතාව කළ සටන් පිළිනොගත්, ඒ හැම දේකටම එරෙහි වූ රනිල් වික්‍රමසිංහ හා ඔහු නායකත්වය දෙන යූ ඇන් පී කල්ලිය ද, රවුප් හකීම් නායකත්වය දෙන මුස්ලිම් කොන්ග්‍රසය ද මාර්තුවේ පැවැත්වූ මැතිවරණය ප්‍රතික්ෂේප කරමින් වර්ජනය කළහ. එහෙත් මේ දෙන්නා ම මෑතකදී වෙනස් වී නැගෙණහිර පළාත් ඡන්දයට සහභාගිවන්නට තීරණය කර ඇත. මෙම බල්ටි ගැසීමට හේතුව මෙයයි.

සති කීපයකට පෙර රනිල් වික්‍රමසිංහ මහතා දකුණු ඉන්දියාවේදී ද්‍රවිඩ ජාතික සන්ධානයේ **TNA** මන්ත්‍රීන් කණ්ඩායමක් හමුවී සාකච්ඡා කොට තිබේ. **TNA** යනු කොටින් ගේ අතකොළු වශයෙන් උන්ගේ තුවක්කු බලයෙන් උතුරේ ජනතාවගේ නිදහස් ඡන්දය වැළැක්වූ, ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවකින් අපේ පාර්ලිමේන්තුවට රිංගාගත් ද්‍රෝහීන් රැළකි. රනිල් ද උන් හා සාකච්ඡාකිරීම පුදුමයක් නොවේ. ඔහු ලංකාවට විත් **TNA** නායකයෙකු වන සම්බන්ධන් මන්ත්‍රීවරයා සමග ද සාකච්ඡාකර ඇත. කොටින්ගේ පණිවුඩය රනිල්ට ලැබෙන්නට ඇති බව නිසැකය. රවුප් හකීම් ගැනද අමුතුවෙන් කිවයුතු නොවේ. මේ ජෝඩුව කොටින්ට බැලමෙහෙවර කිරීමට ඉදිරිපත්ව සිටිති. ඒ මිස ඔවුන්ගේ පක්ෂ සංවිධාන වලින් සාකච්ඡාකර ගත් තීරණ අනුව නොවේ. දැන් මේ දෙදෙන උතුර සහ නැගෙණහිර වෙන්කිරීමට රජය සහ සකල ලාංකික ජනතාව ගත් තීරණයට එරෙහිව එළියට බැස තිබේ. මේ කාර්යය ඉටුකර ගැන්මට අවශ්‍යව තිබෙන අනිත් එකම කණ්ඩායම නම් ත්‍රස්ත වාදී කොටින් පමණකි. ඉතින් මේ දෙදෙන කාගේ මෙහෙවර සඳහා එළිබැස්සා දැයි යන්න ඉතා පැහැදිලිය. කොටින්ට නුදුරු අනාගතයේ අත්වන නියත පරාජය සහ විනාශය වලක්වා නැවත උතුරු නැගෙණහිර ජනතාව කොටින්ට බිලිකිරීමය. මේ ප්‍රයත්න පිටුපස නෝර්වේ ප්‍රමුඛ තුච්ඡ බටහිර ගැති බලවේගද ඇතිවාට සැක නැත. එහෙත් මේ සියල්ලට නැගෙණහිර ජනතාව මැයි 10 වෙනිදා නිසි පිළිතුරු දෙනවා නිසැකය.

## ජාත්‍යන්තර ලෙස විමසිලිමත්වීම

ඇත්ත ඇති සැටියෙන් දැකීමට නම් අපගේ අවධානය අප දේශයට පමණක් සීමාවීම ප්‍රමාණවත් නැත. වෙනස් වන ලෝකයක් තුළ අප රටද ජාත්‍යන්තර වෙනස්වීම් සිදුවන සහ බලපාන ආකාරය ගැන නිරතුරුව දැනුවත්ව සිටීම ඉතා වැදගත්ය. එසේ නොකළ හොත් අප අතරමං වෙනවා ඇත.

පසුගිය දශක දෙක තුනක පමණ කාලය තුළ ලෝක ආර්ථික බල තුලනයේ වෙනස්වීමක් සිදුවී තිබේ. එහි වැඩි ශක්තිය

**4 වන පිටුව බලන්න ⟶**


ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/





ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3